# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2315/12 - 2023 ජනවාරි මස 17 වැනි අඟහරුවාදා - 2023.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**
**76අ වගන්තිය යටතේ නියමය**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 31 වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් "එම අපේක්ෂකයා හෝ තැනැත්තා තරුණයකු වන අවස්ථාවක, තම උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් හෝ උප්පැන්න සහතිකය ලබාගැනීමට නොහැකි විට තරුණයා විසින් තම උපන්දිනය සහතික කරමින් අත්සන් කළ දිවුරුම් ප්‍රකාශයක් හෝ එකී නාමයෝජනා පත්‍රයට ඇමිණීම පැහැර හැරීම" යන වගන්තිය පැවතිය ද තරුණ අපේක්ෂක නියෝජනය අනිවාර්ය අවශ්‍යතාවයක් බවට විධිවිධාන පැවති අවස්ථාවේ තිබූ මෙම වගන්තිය 2017 අංක 16 දරන ඡන්ද විමසීම් පනත මගින් එකී තරුණ අපේක්ෂක අනිවාර්ය නියෝජනය අවශ්‍යතාවය ඉවත් කර ඇති නිසා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් නොසලකා හරිනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**නිමල් ජී පුංචිහේවා,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එස්. බී. දිවාරත්න,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. එම්. මොහමඩ්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**කේ. පී. පී. පතිරණ,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**පී. එස්. එම්. චාල්ස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2023 ජනවාරි මස 17 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය.


1A - G 38744 — 16 (2023/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*